# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 74 — 1973 අගෝස්තු 24 වැනි සිකුරාදා — 1973.08.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 1091 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් | — | රට හිම විකිණීමට බලපත්‍ර සඳහාවූ අයදුම් පත් | — |
| මුදු බාගිරාදිය විකිණීම | 1101 | ටෙන්ඩේසි කිරීම් පිළිබඳ දැන්වීම් | — |
| තෝවුමල් ජර්න්ද හා වෙනත් ජර්න්ද විකිණීම... | — | විවිධ දැන්වීම් | — |


## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ලංකා ගමනාගමන මණ්ඩලය

#### අලාභහානි වූ හා මල බැඳුන හිස් පීප්ප

ලංකාව මුළුල්ලේ ලංගම ඩිපෝවල තිබෙන අලාභ හානිවූ හා මල බැඳුන තුනී සහ ඝන වගීවල ගැ. 45/46 ප්‍රමාණයේ හිස් පීප්ප මිළට ගෙන හැරගෙන යෑම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනා ගමන මණ්ඩලිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.09.18 වෙනි දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 10 මුදලක්ද, ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 250 මුදලක්ද තැන්පත් කිරීමෙන් පසු 1973.09.17 වෙනි දින ප. ව. 3 වන තෙක් මගේ කාර්යාල යෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

සම්බන්ධ ඩිපෝ අධිකාරීන් සමග කලින් නියම කර ගැනීමෙන් සාමාන්‍ය වැඩ කරන වේලාවන් තුල මෙම පීප්ප පරීක්ෂාකර බැලිය හැක.

ඒ ඒ ඩිපෝවල තිබෙන පීප්ප ගණන හා වෙනත් විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන සම්පාදක නිලධාරි තැන.

සම්පාදන කොට්ඨාශය,
වේරහැර, බොරලැස් ගමුව.

8-942—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

#### පිරිතෙල් හෝස් සැපයීම

පිරිතෙල් හෝස් සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සහ නියාමිතයන් ආපසු ලබා ගත හැකි රු. 100 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු, ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

1973 සැප්තැම්බර් 11 වෙනි දින පෙ. ව. 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කෙරේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

8-938—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

### උඩවලවේ ව්‍යාපාරයේ සත්ව පාලන මධ්‍යස්ථානයට අවශ්‍ය කෘතිම රේතෝධාන උපකරණ සැපයීම

ටෙන්ඩර් අංක "අයි" ටෙන්ඩර් අවසාන දිනය : 1973 ඔක්තෝබර් 30 වෙනි දින.

1. උඩවලවේ යෝජනා ක්‍රමයේ ඉහත සඳහන් ස්ථානයට අවශ්‍ය රසායන ද්‍රව්‍ය සැපයීම සහ භාරදීම සඳහා ලංකාවේ, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415, දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ඔක්තෝබර් මස 30 වෙනි දින පෙ. ව. 10 ය තෙක්, ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම සැපයීම ලබා ගැනීම සඳහා මුදල් යොදවනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වල ණය මුදලින් බැවින්, ලබාගත යුතු **යෝග්‍ය ස්ථානවල සැපයුම් කරුවන්** ගෙන් සහ ඔවුන් වෙනුවෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. විශේෂ අරමුදල් සම්පත් වලින් සැපයීම් ලබා ගන්නේ පහත සඳහන් යෝග්‍ය ස්ථාන වලිනි :—ඔස්ට්‍රේලියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මන් සමූහාණ්ඩුව, පින්ලන්තය, ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජ්‍යය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධනය වන සාමාජික රටවල් :—(ඇප්ගනිස්ථානය, බන්ගලා දේශය, හොංකොං, ඉන්දියාව, ඉන්දුනීසියාව, කෝමර් සමූහාණ්ඩුව, දකුණු කොරියන් සමූහාණ්ඩුව, ලාඕස්, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, චීන සමූහාණ්ඩුව, (තායිවානය) ෆිජී, පිලිප්පීනය, සිංගප්පූරුව, තායිලන්තය, ටොන්ගාව, බටහිර සමෝවාව, පපුවා සහ නිව්ගිනියා දේශ සීමාව, වියට්නාම සමූහාණ්ඩුව, (සයිගොන්)

4. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

5. ටෙන්ඩර් ලියකියවිලි පහත සඳහන් තානාපති කාර්යාල වලින් ද ලබාගත හැක.

(අ) ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ආ) කැනඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් තුමා
(ඇ) ඩෙන්මාර්කයේ සිටින ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් තුමා
(ඈ) ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුවේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා, බෙල්ජියම සහ නෙදර්ලන්තය
(ඉ) පින්ලන්තයේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ඊ) ජපානයේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(උ) එක්සත් රාජධානියේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ඌ) ඉන්දියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(එ) වෙළඳ කොමසාරිස් තුමා, බොම්බාය, ඉන්දියාව.
(ඒ) ඉන්දුනීසියාවේ සිටින අතිගරු ශ්‍රී ලංකා තානාපති තුමා
(ඔ) සිවුල්හි කොරියන් සමූහාණ්ඩුවේ සිටින ආර්ථික සහයෝගතා පිළිබඳ අධ්‍යක්ෂකතුමා
(ඕ) මලයාසියාවේ සිටින ශ්‍රී ලංකා මහා කොමසාරිස් තුමා
(ක) බටහිර පකිස්ථානයේ සිටින ශ්‍රී ලංකාවේ වෙළඳ කොමසාරිස් තුමා
(කා) ශ්‍රී ලංකා තානාපති තුමා, මැනිලා, පිලිපයින්ස්
(කැ) ගරු වෙළඳ කොමසාරිස් තුමා, සිංගප්පූරුව
(කෑ) සංවර්ධන අධ්‍යක්ෂක ජාත්‍යන්තර සහයෝගතා සහ සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශය ටයිපෙයි, චීන සමූහාණ්ඩුව
(කි) තායිලන්තයේ ලංකා නියෝජිත තානාපති තුමා
(කී) විදේශ අමාත්‍යාංශය, සයිගොන් වියට්නාමය
(කු) ලංකා තානාපති තුමා, බුරුමය.

යෝග්‍ය ස්ථානවල ප්‍රධානීන් වෙනුවෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන මෙරට නියෝජිතයින් විසින් ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, අවලංගු කරන ලද මින් එක් එක් කට්ටලයක් වෙනුවෙන් රු. 5 ක ගාස්තුවක් ද, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරීට මුදලින් ගෙවිය යුතුය.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

තැ. පෙ. 524,
කොළඹ 7,
1973 අගෝස්තු මස 24 දින.

8-941—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොහු කර්මාන්ත සඳහා අවශ්‍ය සායම් සහ රසායන සැපයීම සඳහා ඒවා නිපදවන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයින්ගෙන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාතීමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.10.24 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත්‍රය සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

යොමු : 3/1—(4/32)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ—1,
1973 අගෝස්තු මස 10 වැනි දින.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

8-878—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

### බඩු බාහිරාදිය ලොරිවලින් ප්‍රවාහණය කිරීමේ සේවාව— මාතර/තිස්සමහාරාමය

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මාතර/තිස්සමහාරාමය ප්‍රදේශයේ හා මාතර දුම්රිය ස්ථානයට හෝ එම දුම්රිය ස්ථානයෙහි සිට හෝ බාහිර නියෝජ්‍ය ස්ථාන වලට සහ එම දුම්රිය ස්ථානය හා බාහිර නියෝජ්‍යස්ථාන සේවය කරන අවට ප්‍රදේශයන්ටද මුදල්, බඩු, පාර්සල් සහ අනිකුත් සෑම වර්ගයකටම අයත් බඩු බාහිරාදිය, 1973 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1975 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා වූ කාලය තුළ ප්‍රවාහණය කිරීම සඳහා, 1973 සැප්තැම්බර් මස 20 වෙනි බ්‍රහස්පතින්දා පූ. භා. 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තව වර්ෂයකට මෙම කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමේ අභිමතය ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලය සතුව ඇත.

බඩු බාහිරාදිය ප්‍රවාහණය කිරීම සඳහා ටොන් එකකට සැතපුමකට අය කරන ගාස්තුවද, නිතිපතා නියමිත වේලාවන්ට ධාවනය කරන දිනකට එක් වරක් යැම්-ඊම් කරන ලොරියට හෝ ලොරිවලට අය කරන මාසික ගාස්තු ප්‍රමාණය, ඒනම් ධාවන මාර්ගයේ අවශේෂ **නියෝජ්‍යස්ථානවලටද යමින් මාතර දුම්රිය ස්ථානය හා ගමනාන්තය හෝ ඒ අතර බාහිර නියෝජ්‍යස්ථානයන් අතර ලොරියෙන් හෝ ලොරිවලින් දිනපතා මුදල් සහ සෑම වර්ගයකම බඩු බාහිරාදිය** පිළිගත් කාල සටහනකට අනුව ගෙනයාමට අය කරන මාසික ගාස්තුවක් ද, ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කළ යුතුය. මෙසේ ඉදිරිපත් කරන ලද මිල ගණන්වලින් දෙපාර්තමේන්තු ගාස්තුව වශයෙන් 10% ක් අඩුකරගනු ලැබේ. බඩු ප්‍රවාහණය සඳහා ටොන් එකකට සැතපුමකට අය කරන වඩාත්ම යෝග්‍ය ගාස්තු ප්‍රමාණය ඉදිරිපත් කරන ටෙන්ඩර්කරු ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

කොළඹ, 10 ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1, දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරමවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ලියවිලිවල මිල වශයෙන් රු. 10 ක මුදලක් ද, ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 1,000 ක මුදලක් ද ගෙවා ටෙන්ඩර් ලියවිලි සහ මේ පිළිබඳ අනිකුත් සියළු තොරතුරු 1973 සැප්තැම්බර් මස 19 වෙනි බදාදා පස්වරු 1 වන තෙක් එකී දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරිගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර්කරුට අයත් ලොරිවල ලියාපදිංචි කරන ලද හැඳින්වීමේ අංක හා නියමිත බර ප්‍රමාණයද නිවැරදි බවට මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස්ගෙන් හෝ බලපත්‍ර අධිකාරීගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. හොණ්ඩර 20 ක හෝ හොණ්ඩර 40 ක හෝ ලොරියක් අවශ්‍ය වූ විට එය සැපයීමට ටෙන්ඩර්කරුට අපහසු නම්, ඒ වෙනුවට වැඩි බර ප්‍රමාණයක ලොරියක් යොදවා අවශ්‍ය බර ප්‍රමාණයට පමණක් ගාස්තුව ලබා ගන්නා බවටද ටෙන්ඩර්කරු ලියවිල්ලකින් පොරොන්දු විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුව හොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුන හොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ:—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩුකරගනු ලැබේ.

1973 අගෝස්තු මස 15 දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

එච්. සී. උහරගොඩ,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | මස් | කරවල | බිත්තර | එළවලු | රෝගීන්ට: මාළු | මස් | කරවල | බිත්තර | එලවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අළුත්ගම ගැමි රෝහල | 100 | ... 135 | 1973 සැප්තැම්බර් මස 4 දින පෙ.ව. 10.00ට | 19... | 20... | 19... | 18... | 57... | 96... | 103... | 103... | 94... | 283 |
| 2. අළුත්ගම්වීදිය ගැමි රෝහල | 100 | ... 135 | | 29... | 30... | 29... | 29... | 88... | 299... | 244... | 239... | 257... | 771 |
| 3. බෙරුවල මාතෘ නිවාසය | 100 | ... 135 | | 33... | 31... | 34... | 34... | 102... | 52... | 37... | 44... | 47... | 141 |
| 4. බුලත්සිංහල ... මාතෘ නිවාසය | 100 | ... 135 | | 60... | 66... | 62... | 64... | 191... | 113... | 119... | 122... | 99... | 298 |

8–990—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**මහවැලි සංවර්ධන මණ්ඩලය—බෝවතැන්න**

යාන්ත්‍රික කම්හල් ගොඩනැගිල්ල තැනීම සඳහා ටෙන්ඩර්

නාඋල, යාන්ත්‍රික කම්හල් ගොඩනැගිල්ල තැනීම සඳහා ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

මේ හා සමාන වැඩ සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති රජයේ දෙපාර්තමේන්තුවක, මණ්ඩලයක හෝ සංස්ථාවක රු. 50,000 ක හෝ වැඩි ගණනකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

ටෙන්ඩර් පත්‍ර 1973.09.07 වන දින දක්වා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් නාඋල, මහවැලි සංවර්ධන මණ්ඩලයේ, බෝවතැන්න ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු තැනගෙන් හෝ කොළඹ 5, ජාවත්ත පාරේ, අංක 11 දරන ස්ථානයෙහි මහවැලි සංවර්ධන මණ්ඩලයේ, සාමාන්‍යාධිකාරී තැනගෙන් හෝ කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

ටෙන්ඩර් පත් භාර ගැනීම 1973.09.11 වනු දින පෙ. ව. 11 ට අවසන් වනු ඇත.

මේ සම්බන්ධයෙන් වැඩිමනත් විස්තර නාඋල, මහවැලි සංවර්ධන මණ්ඩලයේ, බෝවතැන්න ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

පී. සිවසුබ්‍රමනියම්,
ප්‍රධාන ව්‍යාපාර ඉංජිනේරු,
බෝවතැන්න.

නාඋල,
මහවැලි සංවර්ධන මණ්ඩලය.

8–971—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කලු ගම්මිරිස් ඇට විකිණීම**

කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කලු ගම්මිරිස් ඇට රාත්තල් 504ක් විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1973.09.13 වන දින පස්වරු 2 වනතෙක් භාරගනු ලැබේ.

2. කුණ්ඩසාලේ,ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ යෙන් ලබාගන්නා ලද ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "කුණ්ඩසාලේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාසැල් ගොවිපලේ ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති" නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කලු ගම්මිරිස් මිළට ගැනීම කියා සඳහන් කළ යුතුයි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. 1973.09.11 වන දින දවල් 11 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැක. ගිවිසුම් පත්‍ර අත්සන් කළ පසු මෙම මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකිවිණි නම්, ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරිය වුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් වෙතොත්, එය අයකර ගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර "කුණ්ඩසාලේ පාසැල් ගොවිපලේ කලු ගම්මිරිස් ඇට මිළට ගැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ද, ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද කවරයේ සඳහන් කොට "කුණ්ඩසාලේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පාසැල් ගොවිපලේ, ගොවිපල් පාලනය හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන" වෙත ටෙන්ඩර් කරු විසින්ම හෝ ඔහුගේ නියෝජිතයින් විසින් පුද්ගලිකව භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනම, ලියා පදිංචි කළ තැපෑලෙන්

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කොට පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් ඉහළ කෙළවරේ වැඩයෙහි නම ලියා තැබිය යුතුයි. ටෙන්ඩර් පෝරම තැපෑලෙන් නො එවන්නේ නම්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

5. 1973.09.14 වන දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝරම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලියකියවිල් ලැබීන් දැන් වූ පසු දින 10 ක් ඇතුළත ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමට හා ඇප මුදල් තැබීමට අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝරම ලබා ගැනීම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

7. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයෙන්ම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කරනු ලබන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ජයග්‍රාහී ටෙන්ඩර්කරුට භාරදෙන ලද කොන්ත්‍රාත්තුවේ වැඩ කරගෙන යන අතරතුරදී කොටස් මුදල් ලබා ගැනීමට අවශ්‍ය වුව හොත් එවැනි අවස්ථාවලදී කරන ලද වැඩවල තක්සේරු කැරුන වටිනාකමින් සියයට 90 කට සරිලන ප්‍රමාණයේ කොටස් මුදල් ලබා ගත හැකියි.

9. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් විස්තර ඇත්නම් හම්බන් තොට දිසාපතිගෙන් විමසීමෙන් ලබාගත හැකියි.

ඩබ්ලිව්. පී. එස්. ජයවර්ධන,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

1973.08.09,
හම්බන්තොට දිසාපති කාර්යාලයේදී ය.

8-900—73.08.24 දින අංක 74 දරණ ගැය වපත්‍රය

---

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

මානසික රෝහල, අංගොඩ—කිළිටි රෙදි ඇපිල්ලීම

**සේවය හා ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1974 ජනවාරි 1 වැනි දින සිට 1974 දෙසැම්බර් 31 වන දයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවන වගන්තියේ දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි ඇපිල්ලීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අංගොඩ මානසික සෞඛ්‍ය සේවා අධිකාරී විසින් බාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—මෙම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් කරන ලද මුදල මා නමට කොළඹ කච්චේරියෙහි තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා මෙවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිති වල ලියාපදිංචි කළ අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

3. **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

4. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට දන්විය යුතුයි.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල් අහිමිවන්නට ඉඩ තිබේ.

5. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මසකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මෙහි පහත සඳහන් උපලේඛනයේ 5 වන වගන්තියේ දක්වා ඇත.

6. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා මානසික සෞඛ්‍ය සේවා අධිකාරි (අංගොඩ) කියා එවිය යුතුයි. සීල් කරන ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාව සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරෙහි ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් තමාම ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් එය ලැබුණු බවට කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

7. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත සඳහන් උපලේඛනයෙහි 6 වන තීරයේ සඳහන් දිනයෙහි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැක.

9. **ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉක්මවන තුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එක කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයෙහි පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර පිළිපැදිය යුතුද වන්නේය.

12. **අනිත් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන් වලට අනුව කොන්ත්‍රාත්කරු දැරිය යුතුයි.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙන යාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීති වලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන ඇති අයට පමණි.

(iv) ටෙන්ඩර් කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳීමෙන් පසු ඉල්විය හැක.

1973 අගෝස්තු 10 වැනි දින,
මානසික සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අංගොඩ.

වෛද්‍ය ඒ. ටී. සමරසේන,
මානසික සෞඛ්‍ය සේවා අධිකාරි, අංගොඩ.

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ඇප තැන්පත් මුදල | මසකට සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු සාමාන්‍ය කෑලි ගණන | ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| මානසික රෝහල, අංගොඩ.—අංශ 1 සහ 2 පිරිමි වාට්ටු 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 11 සහ 14 | 100 | 500 | 4 | 7,000 | 1973.09.11 පෙ.ව. 10 |
| අංශ 3 ගැහැණු වාට්ටු 21, 22, 23, 24, 25, 26, 27, 28, 29 | 100 | 500 | 4 | 7,500 | එම |
| අංශ 4 ක්ෂය රෝග හා අනෙකුත් බෝවන රෝග වාට්ටු අංක 15, 16, 17, 18, 32, 33, 34 සහ 35 | 100 | 300 | 5 | 3,000 | එම |
| අංශ 5 වාට්ටු 19, 20 පිරිමි විලාස්, ගැහැණු විලාස් | 100 | 300 | 4 | 4,000 | එම |
| මුල්ලේරියාව රෝහල—අංක 1 | 100 | 300 | 4 | 3,500 | එම |
| මුල්ලේරියාව රෝහල—අංක 2 | 100 | 300 | 4 | 5,500 | එම |

8–896—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

යොමුව : පිඑස්ඩී 1/59/73.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ඔපරේෂන් ස්ටූල්ස් සැපයීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම

පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන පරිදි ඔපරේෂන් ස්ටූල්ස් සැපයීම පිණිස 1973.09.28 දින පූ. භා. 10 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපත් විසින් දේශීය නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් තමන් විසින්ම සකස් කළ ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සම්පූර්ණ කොට කවරවල බහා මුද්‍රා තබා '' ඔපරේෂන් ස්ටූල්ස් සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් කවරයේ වම් කෙළවර මුදුනේ සඳහන් කොට කොළඹ 10, තැ. පෙ. 584 සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර්පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ගිණුම් අංශයේ) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමට හෝ ලේඛනගත තැපැලෙන් එවීමට පිළිවන. ලේඛනගත තැපැලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන් තමන්ම හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් සැපයීම් විස්තර නම සහ ලිපිනය සඳහන් මුද්‍රා සහිත කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ එවැනි ටෙන්ඩර් භාර ගැනීමට බලයලත්, ප්‍රධාන ගණකාධිකාරි වෙත පුද්ගලිකව භාරදිය යුතුයි. මුද්‍රා සහිත ටෙන්ඩරය භාර දෙන්නට ඔහු විසින් ටෙන්ඩරය භාරගත් බවට දැනුම් දීමේ කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. රුපියල් 100 ක මුදලක් කච්චේරියක (කොළඹ කච්චේරියේ) හැර හෝ කොළඹ ඩීන්ස් පාරේ අංක 355 හි රජයේ බෙහෙත් ගබඩා අධිකාරි කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. මුදල් තැන්පත් කළ බවට ලද රිසිට්පත ටෙන්ඩරයට ඇමිණිය යුතුයි.

5. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හේතු නොදක්වා ඉවත දැමීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. මෙම දැන්වීමේ සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ ලෙස පිළිපැදී නොමැති කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත කාලසීමාව තුළදී ඔපරේෂන් ස්ටූල්ස් සැපයීමට අසමත් වුවහොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරන අතර වැඩි දුරටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු පිණිස බලය ලත් නිලධාරි තැනට වාර්තා කරනු ලැබේ.

7. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඉහත 2 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී, නියමිත දින, නියමිත වේලාවට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම ඉල්ලුම්කොට ඇති මිළ ගණන්ද පැමින ඇති ටෙන්ඩර්කරුවන්ට ප්‍රකාශ කරනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ යම් ටෙන්ඩරයක් නිරීක්ෂණය කිරිම සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙතින් පිළියෙල කොට ගත් අවස්ථාවකදී ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත නිරීක්ෂණය කිරීමට ඉඩ දෙනු ලැබේ.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 අගෝස්තු මස 9 දින,
කොළඹ, රජයේ බෙහෙත් ගබඩාවේදී ය.

### Schedule Referred to

| Item No. | Quantity | Description |
|---|---|---|
| 1 | 36 only | Stools Operation (Metal top adjustable for surgeons) |
| 2 | 50 only | Stools Operation (Cushion top) |
| 3 | 100 only | Cushion for school dental chairs |
| 4 | 30 only | School Dental Chairs Newzealand pattern |
| 5 | 25 only | Instrument Cabinets with glass shelves |
| 6 | 2,000 only | Sputum Mugs |
| 7 | 2,000 only | Bedpans enamel |
| 8 | 5,000 only | Trays Rectangular enamel 3 sizes |
| 9 | 2,000 only | Trays Kidney 8″ enamel |
| 10 | 1,000 only | Trays Kidney 10″ enamel |
| 11 | 1,000 only | Trays Triangular enamel |
| 12 | 2,000 only | Bowls enamel 8″ |

*Note.*—Specimen of the above items could be examined at the Civil Medical Stores, 355, Deans Road, Section 'D'.

*Delivery terms.*—The full quantities of items 1 to 12 should be delivered at Civil Medical Stores, Colombo within three months of date of order.

8–856—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

යොමුව : පීඑස්සී/1/18/73.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රේඩියෝපේක් කොන්ට්‍රාස්ට් මීඩියා ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් රේඩියෝපේක් කොන්ට්‍රාස්ට් මීඩියා ආදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ :—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ ;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින් ;

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස්පාර දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.10.23 දින පෙරවරු 10 තෙක් බාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල, ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින් ;

(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගමවලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍ය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදී රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයන්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්තවරු සහ නියෝජිතයින් විදේශීය සමාගමවලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පි. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, 1973.08.9.

SCHEDULE REFERRED TO

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Radiopaque Contrast Media in Aquous Solution 50 per cent. suitable for Bronchoscopy | 500 × 20 ml. vials .. | In any convenient packing |
| 2 .. | Radiopaque Contrast Media suitable for Myelography and Ventriculography | 2,000 × 3 ml. ampoules .. | do. |
| 3 .. | Radiopaque Contrast Media suitable for oral cholecystography .. | 8,000 tablets .. | do. |
| 4 .. | Radiopaque Contrast Media suitable for intravenous Cholecystography | 1,000 × 20 ml. ampoules .. | do. |
| 5 .. | Barium Sulphate Powder for Barium Meal and Enemas. .. The Barium Sulphate should have a particle size of 0.1U–1U with an average particle size of 0.5U. It should not contain a flavouring agent or suspending agent. The small size of the Barium Sulphate particles should ensure adequate suspension | 7,000 kilos .. | In 3 kilo tins |
| 6 .. | Radiographic contrast media for Arteriography Aertography and Angio Cardiography. This should consist of the Sodium or Meglumine Salts or a suitable combination of the two salts of one of the following acids : (*a*) Iothalmic Acid ; (*b*) Diatrizoic Acid ; (*c*) Metrizoic Acid. This should have an Iodine content of 370 mg./ml. and above | 6,000 × 20 ml. ampoules .. | In any convenient packing |
| 7 .. | Radiographic Contrast media for intravenous Urography, Arteriography and Cerebral Angiography. This should consist of the Sodium or Meglumine slats or a suitable combination of these two salts of one of the following acids : (*a*) Iothalmic Acids ; (*b*) Diatrizoic Acid ; (*c*) Metrizoic Acid. It should have an Iodine contents of 270–300 mg/ml. | 15,000 × 20 ml. ampolues .. | do. |
| 8 .. | Radiopaque Contrast Media for filling of cavities and tracts. This should be a viscous contrast agent in aquous solution | 1,000 single dose packets .. | do. |
| 9 .. | Lipiodol Ultrafluid .. .. .. | 250 vials .. | do. |

8–857—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

වෙන්දේසියේ විකිණීමකි.

කොළඹ මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගේ ශාඛාව

පහත සඳහන් භාණ්ඩ 1973 අගෝස්තු 31 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අතර වෙන්දේසිය පෙරවරු 9.30 ට ආරම්භ වේ. 1973 අගෝස්තු 29 දින පෙරවරු 9.30 සිට පස්වරු 1 දක්වා තැපැල් තක්සේරුකරුගේ කාර්යාලයේදී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

2. ජ්‍යෙෂ්ඨ අයකැමිගේ හෝ ඔහුගේ සහායකයින්ගෙන් කෙනෙකුගේ අනුමැතියට යටත්ව සහ මෙහි මින් මතු සපයා ඇති අවලංගු කිරීමේ අයිතියට යටත්ව, සාමාන්‍යයෙන් වැඩිම ඉල්ලුම්කරු ගැණුම් කරුවේ. ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර ඇති වන කිසියම් මතභේදයකදී වෙන්දේසිය පවත්වන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

3. හේතු ඉදිරිපත් නොකර ඕනෑම පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයින්ගේ හෝ ලන්සුවක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට, වෙන්දේසිය පවත්වන නිලධාරියාට සහ අයකැමීට පුළුවන.

4. ලන්සුවක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාණ්ඩ ජ්‍යෙෂ්ඨ භූමියෙන් ඉවත් කර ගැනීමට පෙර ඕනෑම වේලාවක දී වෙන්දේසියක් අවලංගු කිරීමේ තනි අයිතිය අයකැමි වෙත තබා ගනී.

5. වෙන්දේසිය අවසානයේදී පිළිගන්නා ලද ලන්සුවේ වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු භාණ්ඩ භාරදීම කරනු ලැබේ.

6. මිළදී ගන්නා භාණ්ඩවල තත්ත්වය සහ ඒවායේ අඩංගු ප්‍රමාණ සම්බන්ධයෙන් ගැනුම්කරු තමාම සෑහීමකට පත්විය යුතු අතර, එකී භාණ්ඩවල ගුණය, ප්‍රමාණය හෝ තත්ත්වය හෝ භාණ්ඩවල මාතෘකා නාමය පිළිබඳව අයකැමි සහතික නොකරයි. ඉදිරිපත් කර ඇති කොන්දේසි පිළිගෙන ඇත්නම් හැර කිසිම හේතුවක් නිසා ගැණුම් මිල අඩුකිරීමකට ගැණුම්කරුට හිමි කමක් නොලැබේ.

7. භාණ්ඩ පිළිබඳ විස්තරවල ඕනෑම වැරැද්දක් හෝ අත්හැරීමක් විය හැකි අතර, එවැනි වැරදි හෝ අත්හැරීම් හෝ කිසිම විධියකින් අවශ්‍යරයක් හෝ වෙන්දේසියට බලපෑමක් නොවිය යුතු මෙන්ම, ඒ වෙනුවෙන් කිසිම වන්දි ගෙවීමක් අනුමත නොකරන අතර, ලන්සු ලියාපදිංචි කිරීමෙන් පසු අනාවරණය වන අඩුවීම් පිළිබඳව කිසිම මිල අඩුකිරීමක් නොකරන අතර, සහ ලන්සු තැබීමකට ප්‍රථම හැම කරුණක් පිළිබඳව මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නෝ තම තමාම සෑහීමට පත්වී සිටි යයි බලාපොරොත්තු වනු ලැබේ.

8. කොළඹ 1, මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරු ගෙන් සවිස්තර ලැයිස්තු ලබා ගත හැකිය.

ඇස් කන්නාඩි ප්‍රේම්
අව් කන්නාඩි (සන්ග්ලාසස්)
මෝටර් රථ උපකරණ
උල්පත් පෑන්
පාකර් බෝල් පොයින්ට් පෑන්
ස්ටේපල්ස්
පාවිච්චි කළ විදේශීය මුද්දර
අත් බෑග්
ට්‍රැක්ටර් කොටස්
'පාකර් 45' උල්පත් පෑන්
හවරි
ඕ. වී. සී. සම්
අත් ඔරලෝසු කොටස්
ප්‍රෙෂර් කුකර් එකක්
සුවඳ විලවුන්
කොන්ඩ සුවඳ කරන
ප්ලාස්ටික් වළලු යනාදිය.

ටී. දූරෙසිරත්නම්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : තැත/වෙන්දේසි/73/3.
තැපැල් තක්සේරු අංශය,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ 1.

8–877—73.08.24 වැනි දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියයි

ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ නඩුවලට ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කළ හා හිමිකම් නොපා ඇති මෙහි සඳහන් භාණ්ඩ ඇතුළු තවත් භාණ්ඩ 1973 සැප්තැම්බර් මස 13 වන දින පෙරවරු 1.00 උසාවි භූමියේදී ගාල්ලේ ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිටදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මහජනයාට මෙයින් දැනුම් දෙමි.

2. එදින දහවල් 12 සිට එම භාණ්ඩ පරීක්ෂා කිරීමට ඉඩ සලසනු ලැබේ.

3. විකිණීමට නියමිත භාණ්ඩවල සම්පූර්ණ ලැයිස්තුවක් වෙන්දේසි කරන දිනට සතියකට පෙර උසාවි දැන්වීම් පුවරුවේ පලකරනු ලැබේ.

4. ගැනුම් කරුවන් විසින් වෙන්දේසිය අවසාන වූ වහාම තමතමන් මිලයට ගන්නා ලද භාණ්ඩ සඳහා මුදල් ගෙවා කුවිතාන්සි ලබාගත් වහාම එම භාණ්ඩ මෙම ස්ථානයෙන් ඉවත්කර ගත යුතුය.

එච්. ඩබ්ලිව්. සේනානායක,
මහෙස්ත්‍රාත්, ගාල්ල.

1973 ක්වූ අගෝස්තු මස 6 වැනි දින,
ගාල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

| | නඩු අංකය | | භාණ්ඩ පිළිබඳ විස්තර | | ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 1. | ඒ1247/72 | ... | අංක එම්ඩී 4045 බයිසිකල් | ... | 1 |
| 2. | ඒ1100/72 | ... | 48367 බයිසිකල් | ... | 1 |
| 3. | 39249 | ... | එප්ආර්83798 | ... | 1 |
| 4. | අංකයක් නැත | ... | බී0190 බයිසිකල් | ... | 1 |
| 5. | අංකයක් නැත | ... | ඔඒ1312 බයිසිකල් | ... | 1 |
| 6. | 54030 | ... | සීඑම්278 බයිසිකල් | ... | 1 |
| 7. | 72432 | ... | ඩීඊ58034 බයිසිකල් | ... | 1 |
| 8. | අංකයක් නැත | ... | ටීඑන්231 බයිසිකල් | ... | 1 |
| 9. | ඒ502/72 | ... | බීඑස්85785 බයිසිකල් | ... | 1 |
| 10. | අංකයක් නැත | ... | 71ජේ538 බයිසිකල් | ... | 1 |
| 11. | 65275 | ... | බයිසිකල් | ... | 1 |
| 12. | ඒ352/72 | ... | 8780 බයිසිකල් | ... | 1 |
| 13. | ඒ531/70 | ... | බයිසිකල් | ... | 1 |
| 14. | අංකයක් නැත | ... | ඒඉසඩ් 512 බයිසිකල් | ... | 1 |
| 15. | 66337 | ... | එෆ්ජී 57600 බයිසිකල් | ... | 1 |
| 16. | 294/70 | ... | බයිසිකල් | ... | 1 |
| 17. | අංකයක් නැත | ... | බීආර්66861 බයිසිකල් | ... | 1 |
| 18. | බී273 | ... | 57820 බයිසිකල් | ... | 1 |
| 19. | 65470 | ... | කේඑක්ස්15858 බයිසිකල් | ... | 1 |
| 20. | 999/69 | ... | අයිඑෆ්ජේ13638 බයිසිකල් | ... | 1 |
| 21. | 63772 | ... | සීබී11465 බයිසිකල් | ... | 1 |
| 22. | 864/72 | ... | එන්70226 බයිසිකල් | ... | 1 |
| 23. | 863/72 | ... | එෆ්ජී 37444 බයිසිකල් | ... | 1 |

8–881—73.08.24 වැනි දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## දිස්ත්‍රික් උසාවිය—අනුරාධපුර

### රාජසන්තක කළ සහ අයිතිවාසිකම් නොකියන ලද භාණ්ඩ

### ප්‍රසිද්ධ වෙන්දේසිය

අනුරාධපුර දිස්ත්‍රික් හා මහේස්ත්‍රාත් උසාවියේදී පවරණ ලද නඩුවල රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත දක්වා ඇති භාණ්ඩ 1973 සැප්තැම්බර් මස 4 වෙනි දින ප.ව. 2 ට උසාවි ගොඩ නැගිල්ලේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| | නඩු අංකය | | භාණ්ඩ | |
|---|---|---|---|---|
| 1. | ඒ 646/72 | ... | පාපැදිය ඒඊ 80342 | |
| 2. | ඒ 1885/70 | ... | පාපැදිය ඩීඇම් 540 | |
| 3. | ඒ 2078/70 | ... | පාපැදිය සීඑම් 286 | |
| 4. | ඒ 299/71 | ... | පාපැදිය සීබී 672 | |
| 5. | ඒ 1842/70 | ... | පාපැදිය ඩීපී 926 | |
| 6. | ඒ 451/72 | ... | පාපැදිය ජීඩී 9874 | |
| 7. | ඒ 380/72 | ... | පාපැදිය සීඑන් 2535 | |
| 8. | ඒ 380/72 | ... | පාපැදිය ඒඑස් 0947 | |
| 9. | ඒ 373/72 | ... | පාපැදිය ඒබී 52520 | |
| 10. | 39649 | ... | බෙලෙක් තහඩු | 15 |
| 11. | 26411 | ... | බුරුත කොටන් | 19 |
| 12. | 26412 | ... | බුරුත කොටන් | 18 |
| 13. | 40787 | ... | බුරුත කොටන් | 5 |
| 14. | 40787 | ... | තේක්ක කොටන් | 7 |
| 15. | 35939 | ... | තේක්ක කොටන් | 5 |
| 16. | 41174 | ... | හුලංහික් ලෑලි | 59 |
| 17. | 44845 | ... | වල් ඇඹරැල්ල සහ දියලබු කොටන් | 46 |
| 18. | 39333 | ... | බුරුත කොටන් | 17 |
| 19. | 30860 | ... | හල්මිල්ල කොටන් | 17 |
| 20. | 35426 | ... | බුරුත කොටන් | 3 |
| 21. | 35426 | ... | වැවරන කොටන් | 1 |
| 22. | 40335 | ... | බුරුත ලෑලි | 76 |
| 23. | 25470 | ... | හල්මිල්ල ලෑලි | 110 |
| 24. | කටුකම්බි රෝල් | | | |
| 25. | විදුලි පන්දම් | | | |
| 26. | කැති | | | |
| 27. | හිස් බෝතල් | | | |
| 28. | බූලි (වීදුරු) | | | |
| 29. | බූලි (ප්ලාස්ටික්) | | | |
| 30. | හිස් බැරල් | | | |
| 31. | හිස්ටින් | | | |
| 32. | උදලු | | | |
| 33. | බාල්දි | | | |
| 34. | ඇල්මිනියන් මුට්ටි | | | |
| 35. | තඹ කම්බි | | | |
| 36. | පොරෝ | | | |
| 37. | නඩු අංක 37468 අලාභහානිවූ ප්‍රදර්ශන වීදුරු අල්මාරිය. | | | |
| 38. | නඩු අංක 37662 අලාභහානි වූ ප්‍රදර්ශන වීදුරු අල්මාරිය. | | | |

1. මෙම ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීමට යම් කෙනෙක් කැමැති නම්, ලේකම් මහතාගේ අනුමැතිය ලබා මෙම විකිණීම ආරම්භ කිරීමට පැයකට පෙර පරීක්ෂා කර බැලිය හැකි බවත්, තමන් ඉල්ලූ මුදලට මෙම ද්‍රව්‍ය තීරණයවූ විට සම්පූර්ණ මුදලම ගෙවා විකිණීම අවසන් වූ විට බඩු රැගෙන යා යුතු බවත්, චෙක්පත් මගින් ගෙවීම් භාර ගනු නොලබන බවත් තව දුරටත් දැනුම් දෙමි.

ඩබ්ලිව්. පී. එන්. ද සිල්වා,
දිස්ත්‍රික් විනිශ්චයකාරතුමා හා මහෙස්ත්‍රාත්,
අනුරාධපුරය.

1973 අගෝස්තු මස 8 වෙනි දින,
අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ දී ය.

8–865—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

## අත්පතු විකිණීමේ ප්‍රසිද්ධ වෙන්දේසිය යාපනය — මහෙස්ත්‍රාත් උසාවිය

යාපනය මහේස්ත්‍රාත් උසාවිය මගින් රාජසන්තක කරන ලද හා නියමිත කාල සීමාව තුළදී අයිතිකරුවන් විසින් ඉල්ලුම්කිරීම පැහැර හරින ලද්ද වූ ද, පහත විස්තර සඳහන් අත්පතු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 1973 සැප්තැම්බර් මස 6 වැනි දින පෙ.ව. 10 ට (උක්ත උසාවි භූමියේදී) යාපනය—ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් අධියසදී සිදු කරන බැව් පොදු මහජනයා වෙත මෙයින් දන්වා සිටිමි.

2. එදින පෙ.ව. 8—9 දක්වා කාලය තුළදී මෙම අත්පතු මහජන සමීක්ෂණය සඳහා උක්ත උසාවි භූමියේදීම ඉදිරිපත් කෙරෙනු ඇත.

| අනු අංකය | නඩු අංකය | අත්පතුවේ ස්වභාවය | ගණන |
|---|---|---|---|
| 1. | ඒආර් 1538/72 | "රජ" පාපැදි (අංක ඊජ් 50227) | 1 |
| 2. | ඒආර් 84/73 | "රලේ" පාපැදි (අංක ඩීඑල් 41361) | 1 |
| 3. | ඒආර් 86/73 | හානි වූ "හම්බර්" පාපැදි (අංක එෆ්ජ් 44430 සීට එක, ඉදිරි මඩගාඩ එක නැත) | 1 |
| 4. | ඒආර් 74/73 | "රලේ" පාපැදි (අංක ඊඩබ් 2830) | 1 |
| 5. | ඒආර් 26/73 | "රලේ" පාපැදි (අංක ඩීවයි 1492) | 1 |
| 6. | ඒආර් 35/73 | පාපැදි "ප්‍රේම" (අංක ඩීඅයි 3134) | 1 |
| 7. | ඒආර් 27/73 | "රලේ" පාපැදි (අංක සීඑල් 36385) | 1 |
| 8. | ඒආර් 1819/72 | හානිවූ "හම්බර්" යයි සිතිය හැකි පා පැදි (අංක සීසී 577) | 1 |
| 9. | ඒආර් 1319/72 | හානිවූ "රලේ" පාපැදි (අංක ඩීජ් 90494) | 1 |
| 10. | 50656 | "බීඑස්ඒ" පාපැදි (අංක ඊකිව් 1368) | 1 |
| | | "රලේ" පාපැදි (අංක ජේ 37610) | 1 |
| | | "රජ" පාපැදි (අංක ඊටී 2667) | 1 |
| 11. | 47873 | පාපැදි "ප්‍රේම" (අංක සීඑම් 3002) | 1 |
| 12. | ඒආර් 99/73 | හානිවූ "බීඑස්ඒ" පාපැදි (අංක ඊවයි 197) | 1 |
| 13. | 00117 | හානිවූ පාපැදි "ප්‍රේම" (අංක ඩීපී9738) | 1 |
| | | පාපැදි "ප්‍රේම" (අංක ආර්එම් 2673 | 1 |
| | | පාපැදි "ප්‍රේම" (අංක ජීඩබ්ලිව් 1529) | 1 |
| | | ටයර්–ට්‍යුබ් සහිත පාපැදි රෝද | 2 |
| | | පාපැදි "මඩ ගාඩ" | 2 |
| 14. | 1344 | කුඩා පිහි 2 ක්, කුඩා පොරව 2 ක් යා ස්ප්‍රින් බලංශ | 1 |
| 15. | 41659 | හානිවූ කැලි 5 හේ විදුලි පන්දම | 1 |
| 16. | 01366 | ප්ලාස්ටික් කෑන් | 1 |
| 17. | 00522 | "රානි" සඳුන් සබන් කැට | 1 |
| 18. | 01028 | "ලක්ස්ප්‍රේ" ටින් | 1 |
| 19. | 00948 | "fපාර්ගේ" මැන්ටල් | 1 |
| 20. | ඒආර් 22/73 | "ටයිටස්" අත් ඔර්ලෝසු | 1 |
| 21. | ඒආර් 1548/72 | පිත්තල ලාම්පු (මධ්‍යම ප්‍රමාණ) | 2 |
| | | "රිදී" යයි සිතිය හැකි — නයි | 1 |
| | | රිදී යයි සිතිය හැකි පිහන් කැබලි | 3 |
| | | රිදී යයි සිතිය හැකි "වේල්" | 1 |
| 22. | 48471 | මේස ඔර්ලෝසු | 1 |
| 23. | ඒආර් 363/73 | මිට සහිත පොරව | 1 |
| | | වැය 1 ක්, වංගෙඩි 1 ක්, යකඩ පොලු 1 ක් සහ ලී බස්තං 1 ක් | |

කේ. සිවරත්නම්,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්, යාපනය.

1973 අගෝස්තු මස 8 වැනි දින.

8–882—73.08.24 වැනි දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## භාණ්ඩ වෙන්දේසිය

### මහෙස්ත්‍රාත් උසාවිය හැටන්

හැටන් මහෙස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද සහ හිමිකරුවන් විසින් නියමිත කාල සීමාවන් තුලදී ඉවත් කර නොගන්නා ලද පහත සඳහන් වර්ගයේ භාණ්ඩ 1973 සැප්තැම්බර් මස 19 වන දින පෙරවරු 10 ඉහත සඳහන් උසාවියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ.

| | |
|---|---|
| පැට්‍රෝල් ලාම්පු | උදලු |
| ලෑලි | පිඟියා (නොයෙක් වර්ග) |
| පරාල | වීදුරු |
| බෝතල් | සබන් (නොයෙක් වර්ග) |
| කැති | අලවංගු |
| පොරෝ | බාල්දි |

භාණ්ඩ පිළිබඳව විස්තර ලැයිස්තුවක් හැටන් උසාවියේ දන්වීම් පුවරුවේ සහ අවට රජයේ කාර්යාලවල දැන්වීම් පුවරුවල ප්‍රදර්ශණය කරනු ලැබේ.

වෙන්දේසියේදී මිල දී ගන්නා බඩුවලට මුදලින් ගෙවීම කළ යුතු අතර වෙන්දේසිය අවසානයේදී එදිනම බඩු ඉවත් කර ගත යුතුය. එදින පෙරවරු 8 සිට 10 දක්වා මෙම භාණ්ඩ බැලීමට හැකි වේ.

ඩබ්. එන්. ඩී. එච්. විල්ප්‍රඩ්
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්,

1973 අගෝස්තු මස 08 වන දින,
මහනුවර, ප්‍රා. උ. පා. ලේකම් කාර්යාලයේදීය.

8–888—73.08.24 වැනි දින අංක 74 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා **මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ** නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු **ලැබේ.** ඊ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

**ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ලවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් විනාවාන් නැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.**

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.**

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | අඟහරුවාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 ඔක්තෝබර් මස 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.